(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 7(7).]

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 ජනවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා**

## 2013 පෙබරවාරි මස 06 වැනි බදාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— පොදු කොන්ත්‍රාත් පනත යටතේ නියෝග,— ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අංක 1747/10 හා 2012 පෙබරවාරි 29 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත පරිදි අංක 1681/3 හා 2010 නොවැම්බර් 22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් පැවරී ඇති බලය යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 36 වැනි වගන්තිය යටතේ නිකුත් කළ අංක 508/7 හා 1988 ජුනි 02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සංශෝධනය කරමින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 30 දිනැති අංක 1773/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලැබ, 2013.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2908/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය ආඥාපනතේ 67 (අ) වගන්තිය යටතේ ලියාපදිංචිය ලබාදීමේදී එම වෛද්‍යවරුන්ගේ සුදුසුකම් පරීක්ෂාවට ලක් කරන්නේද;

(ii) එවැනි ක්‍රමවේදයක් නොමැතිනම්, විශේෂඥ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) මේ වනවිට පෞද්ගලික රෝහල්වල වංචනික ලෙස විශේෂඥ වෛද්‍ය සේවාවේ යෙදී සිටින බවට වාර්තා වී ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 මාර්තු මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1645/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි බෙලිඅත්ත පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා වර්ෂ ගණනාවක් ගත වී ඇති බවත්;

(ii) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීමෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව තම ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1748/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රජය චීනය හා සම්බන්ධ වී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිවල නම් කවරේද;

(iii) එක් එක් ව්‍යාපෘතියේ සමස්ත වටිනාකමට සාපේක්ෂව චීන ආධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ චීන සමාගම විසින් මෙහි සේවයේ යෙදවීමට ඉල්ලා තිබූ චීන ජාතික ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) චීන ජාතික ශ්‍රමිකයන් සේවයේ යෙදවීමට අදාළව චීන සමාගම් විසින් කරන ලද ඉල්ලීම්වලට එකඟත්වය ලබා දෙනු ලැබුවේද;

(iii) එසේ නම්, එම ඉල්ලීම්වලට එකඟත්වය ලබාදීම සාධාරණීකරණය කරන ආකාරය සහ එසේ එකඟත්වය ලබා දීමට තදින් බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2213/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, විදේශගත ශ්‍රමිකයන් සඳහා රජයෙන් 30%ක දායකත්වය ලබාදෙන නිවාස ණය ක්‍රමයක් සකස් කිරීමට පියවර ගන්නා බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නිවාස ණය ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම නිවාස ණය ක්‍රමය යටතේ ණය ලබාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2378/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා හා ජාත්‍යන්තරව ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපයට හානි කරනු ලබන විදේශීය බලපෑම් අවම කරවීමට අවශ්‍ය අන්තර්ජාතික සහයෝගය ලබා ගැනීමට හිතකර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැඩි දියුණුකිරීමේ අරමුණින් 2011 වර්ෂයේදී රජය විසින් සිදු කරන ලද විදේශ ගමන් කවරේද;

(ii) එම විදේශ සංචාර සඳහා සහභාගීවූවන් කවුරුන්ද;

(iii) ඒ වෙනුවෙන් වැයවූ මුදල කොපමණද;

(iv) එම විදේශ සංචාර නිසා ශ්‍රී ලංකාවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2414/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ රෝහල් සඳහා ශල්‍ය අත්වැසුම් ආනයනය කරන සමාගම් කවරේද;

(ii) ඉහත එක් සමාගමක් විසින් ආනයනය කර වැඩි මිලක් නියම කරන ලද අත්වැසුම් තොගයක් රජයේ රෝහල් වෙත ලබා දීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(iii) එසේ වැඩි මිලට අත්වැසුම් අලෙවි කරන ඉහත සමාගමේ නම කුමක්ද;

(iv) එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමේ අත්වැසුම් තොගය මිල දී ගැනීම වෛද්‍ය සැපයුම් අංශය ප්‍රතික්ෂේප කළේද;

(ii) එම අත්වැසුම් තොගය පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුව මිල දී ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඒ සඳහා අනුමතිය ලබා දුන් බලයලත් නිලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පිළිගත් ක්‍රමවේදයන්ට පරිබාහිරව ඉහත සඳහන් අත්වැසුම් මිල දී ගැනීමේ ගනුදෙනුව සිදුකර තිබේ නම්, එයට හේතු කවරේද;

(ii) එවැනි ගනුදෙනුවක් සිදුකර තිබේ නම්, එය සිදු කළ අය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2491/’12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) බහරේන්හි සේවය කළ, අක්මීමන, හියාරේ, නුගේකන්ද ප්‍රදේශයේ පදිංචි මාදුගැට ගමගේ ධර්මවතී නැමැති තිදරු මවට ඇය සේවය කළ අදාළ නිවසේ හිමිකාර කාන්තාව විසින් බලෙන් කම්බි කොකු ගිල්වීම හේතුවෙන් අසාධ්‍යව මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්;

(ii) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ‘සහන් පියස’ රක්ෂණ ක්‍රමය යටතේ ඇය හිමිකම් මුදලක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහන් පියස රක්ෂණ ක්‍රමය යටතේ ධර්මවතී මහත්මියට හිමිකම් මුදලක් ලබාදීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2971/’12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා වියුක්ත උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් සිටියදී දේශපාලන බලපෑම් මත පුද්ගලයන් 745 දෙනෙකුට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ රැකියා අවස්ථාවන් ලබාදී ඇති බවත්;

(ii) මූලික සුදුසුකම්වත් සපුරා නොමැති මෙවැනි නිලධාරීන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සේවයේ යෙදවීම නිසාවෙන් අද වනවිට එම ක්ෂේත්‍රයේ විවිධ ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දේශපාලන පත්වීම් ලබාදීම අධීක්ෂණය කළ බලධාරීන් කවුරුන්ද;

(ii) දැනුමෙන් පිරිපුන් උපාධිධාරීන් සිටියදී ඔවුන්ට අදාළ පත්වීම් නොදී වෙනත් බලපෑම් මත පත්වීම් ලබාදීමට කටයුතු කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් දේශපාලන පත්වීම් ලබාදුන් නිලධාරීන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයන් ගැනීමටත්;

(ii) ලබාදුන් එම පත්වීම් අවලංගු කොට ඇතිවන පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1964/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරී පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) ඉහත පරිදි ග්‍රාම නිලධාරී පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කරගෙන යාමට විශාල බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට, එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2188/'11

ගරු රවි කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ,

(i) රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව රට තුළ සිදු කළ සමස්ත බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ එක් එක් වරාය සහ නැංගුරම්පොළ අනුව මෙහෙයවන ලද දේශීය බහාලූ ප්‍රමාණය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ පහ තුළ සිදුවෙතැයි අපේක්ෂා කරන බහාලූ මෙහෙයුම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහක කාලය තුළ,

(i) ශ්‍රී ලංකාවේ වරායවල මෙහෙයවන ලද නැව් භාණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ මෙහෙයුම් වියදම සහ උපයාගත් ආදායමේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

(iii) වරාය අධිකාරිය විසින් මෙහෙයවන ලද සාමාන්‍ය නැව් භාණ්ඩ ප්‍රමාණය එක් එක් වරාය සහ නැංගුරම් පොළ අනුව කොපමණද;

(iv) එම භාණ්ඩ අතරින් බහුතර භාණ්ඩ ප්‍රමාණයක ආරම්භක නැව්ගත කළ ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2214/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබාදීම සඳහා තට්ටු නිවාස ඉදිකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබා දීම සඳහා තට්ටු නිවාස ඉදිකිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති එම තට්ටු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තට්ටු නිවාස ඉදිකර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2418/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.02.11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති ගොවි ජනතාවට සහන සැලසීම සඳහා ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම සහනාධාරය ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොවි ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) ආර්ථිකයට විශාල මෙහෙයක් ඉටුකරන එම ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබා නොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1965/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි මලාමුර ඇළ හරහා පාලමක් ඉදිකිරීම සඳහා මුල්ගල් තබා වර්ෂ කිහිපයක් ගතවී ඇතත්, මෙතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) ප්‍රදේශයේ ජනතාවගේ ගමන් පහසුව සඳහා මෙම පාලම කඩිනමින් සකස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මලාමුර ඇළ හරහා පාලම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2189/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1970 - 1977 කාලයේ පැවති රජය යටතේ පාසිකුඩා හි ඛනිජ තෙල් ඇති බව සොයා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඛනිජ තෙල් සොයා ගනු ලැබූ දිනය කවරේද;

(iii) සොයා ගත් ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සොයා ගත් බව වර්තමාන ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, සොයා ගනු ලැබූ ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය දේශීය වෙළඳපලට විකුණනු ලබන දිනය කවරේද;

(iv) තෙල් සහ ගෑස් මිල අඩු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2215/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට ඉදිකිරීම් අවසන් කර, ප්‍රතිලාභීන් පදිංචි කර ඇති සමස්ත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද;

(iii) එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2419/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012. 02. 11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහල දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති පාසල් ප්‍රවාහන සේවාවන් පවත්වා ගෙන යනු ලබන අය සඳහා සහන සැලසීම වෙනුවෙන් ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම පාසල් ප්‍රවාහන සේවා සපයන්නන්හට ඉන්ධන සහනාධාරයක් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) එම සහනාධාරය ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රවාහන සේවා සපයන්නන්හට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) පාසල් දරුවන් වෙනුවෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරන එම ජනතාවට ඉන්ධන සහනාධාරයක් ලබානොදීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 මාර්තු මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1945/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, කටුපොත නගරයේ ඉදිකර ඇති බස් නැවතුම්පළ මීට වර්ෂ දාහතරකට පමණ පෙර විවෘත කළ බවත්;

(ii) විවෘත කළ දින සිට භාවිතයට නොගැනීම නිසා වෙළඳ කුටි 12 ක් ඇතුළු එම ගොඩනැගිලි විනාශවෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ හා වෙළඳ කුටි ප්‍රයෝජනයට නොගෙන අතහැර දැමීමට හේතු කවරේද;

(ii) එම ගොඩනැගිලි නැවත ප්‍රතිසංස්කරණය කර ජනතා අයිතියට පවරාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2190/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 10ක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ පවත්වන ලද මැතිවරණ සංඛ්‍යාව කොපමණද;

(ii) සියලු පළාත් සභා මැතිවරණ එක් දිනයකදී පවත්වනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, එම මැතිවරණ එකවර නොපැවැත්වීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 ජනවාරි 01 වැනිදා සිට මේ දක්වා කාලය තුළ පවත්වන ලද එක් එක් මැතිවරණය සඳහා දරන ලද සමස්ත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඊළඟ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිත දිනය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය භාවිතා නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2216/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, පළමු වර්ෂ පහේදී පොලිය පමණක් ගෙවීමේ පහසුකම සහිත නිවාස ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි එම නිවාස ණය යෝජනා ක්‍රමය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එකී නිවාස ණය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ණය ලබාදීමේදී ප්‍රතිලාභීන් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2420/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව 2012.02.15 වැනි දින හෝ ඊට ආසන්න දිනක හලාවත ප්‍රදේශයේ උද්ඝෝෂණයේ යෙදුණු ධීවරයෙකුට වෙඩි තබා ඝාතනය කර තිබේද;

(ii) එසේ නම්, ඝාතනයට ලක් වූ අයගේ නම කවරේද;

(iii) ඔහුගේ මරණයට අදාළ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේද;

(iv) එම ඝාතනය සිදු කිරීමට අණ දුන් තැනැත්තා කවුරුන්ද;

(v) එම ඝාතනය සම්බන්ධයෙන් රජය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැන්දඹු හා අනත්දරු දායක මුදල් ගෙවා ගැනීමට නොහැකි තරමටම මධ්‍යම පළාත් සභාව දරුණු මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇති බවත්;

(ii) වැන්දඹු හා අනත්දරු දායක මුදල් එම පළාත් සභාවේ සේවකයින්ගේ වැටුපෙන් අඩු කරනු ලැබුවද එම මුදල් සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මධ්‍යම පළාත් සභාව විසින් බැර කිරීමට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට සේවකයින්ගේ වැටුප්වලින් වැන්දඹු හා අනත්දරු දායක මුදල් ලෙස අඩු කරගෙන ඇති මුදල කොපමණද;

(iii) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබූ මුදල් එම ගිණුම්වලට බැර කිරීමට නොහැකිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මධ්‍යම පළාත් සභා සේවකයින්ගේ දායක මුදල් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කිරීමට කටයුතු කිරීමටත්;

(ii) මෙම පළාත් සභාවෙහි පවතින මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3141/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බඩල්කුඹුර නගරයේ ප්‍රධාන මාර්ග දෙපස ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඉහලින් විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන දෙකක් යා කරනු ලබන අධිවෝල්ටීයතාවයකින් යුත් (වොල්ට් 66000) විදුලි රැහැන් පද්ධතියක් ස්ථාපිත කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නගරයක් මධ්‍යයේ ඉහත සඳහන් ආකාරයේ විදුලි රැහැන් ඇදීම සිදු නොකිරීම සාමාන්‍ය ප්‍රතිපත්තිය බවත්;

(ii) එසේ තිබියදී, නගර මධ්‍යයේ එම අධිවෝල්ටීයතාවයෙන් යුතු විදුලි රැහැන් ඇදීම නගරයේ සංවර්ධනයට මෙන්ම නගරවාසීන්ටද විශාල බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම අධිවෝලටීයතාවයෙන් යුතු විදුලි රැහැන් පද්ධතිය ඇද ඇති මාර්ගය වෙනස් කිරීමට ක්‍රියා කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3166/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 49/89 ප්‍රකාරව දේපළ වන්දි ගෙවීමට උතුරු නැගෙනහිර පළාත් සභා අමාත්‍යාංශය කටයුතු කළ අවස්ථාවේදී, එම අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලු දෙනාට වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iii) එසේ ගෙවා නොමැතිනම්, ගෙවීම් කළ ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි නොගෙවන ලද ඉල්ලුම්කරුවන්ට අදාළ වන්දි මුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය අවස්ථාවේදී 49/89 චක්‍රලේඛය අනුව ඉල්ලීම් ඉදිරිපත් කළ පිරිසගෙන් මෙතෙක් වන්දි මුදල් නොලැබී පීඩාවට පත්වූ පිරිසක් සුභසාධන කඳවුරුවල සිට පැමිණ කිළිනොච්චිය හා මුලතිව් ප්‍රදේශවල නැවත පදිංචි වී ඇති බව එතුමා දන්නෙහිද;

(ඇ) ඉහත සඳහන් පිරිසට කඩිනමින් වන්දි මුදල් ලබා දී ඔවුන්ගේ ජීවිතය යථා තත්ත්වයට පත්කිරීමට යම්කිසි පියවරක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1966/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මඟින් පාලනය වූ මාර/කුඩාපාන කණිෂ්ඨ විද්‍යාලය මීට වර්ෂ දහයකට පමණ පෙර සිට වසා දමා ඇති බවත්;

(ii) මේ වන විට පාසල සතු ගොඩනැගිලි විනාශ වෙමින් පවතින බවත්;

(iii) පාසල සතු භූමිය ද විවිධ පුද්ගලයන් විසින් අත්පත් කරගැනීමට උත්සාහ දරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර/කුඩාපාන කණිෂ්ඨ විද්‍යාලය සතු භූමිය හා එම ගොඩනැගිලි වෙනත් ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම පාසල යොදා ගැනීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2260/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2012 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනට ලබා දෙන මහපොළ ශිෂ්‍යත්ව මුදල වැඩි කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2487/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මුතුරාජවෙල තෙත් බිමට අයත් ඉඩම් කොටසක් විකිණීමට, බදු දීමට හෝ බෙදා දීමට හෝ කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මුතුරාජවෙල තෙත් බිමට අයත් ඉඩම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කිරීම සඳහා අදාළ ආයතනයන්ගෙන් අවසර ලබාගෙන තිබේද;

(iv) එම අවසරය ලබා දුන් නිලධාරීන් කවුරුන්ද;

(v) ඉහත අවසර ලබා ගැනීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි පරිදි ඉඩම් ලබා දීමක් සිදුවී ඇත්නම්, එම ඉඩම් ලබාගත් අයගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මුතුරාජවෙල තෙත් බිමට අයත් ඉඩම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කිරීම සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කිරීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2821/'12

ගරු රවි කරුණානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ කාර්යභාරය කවරේද;

(ii) අමාත්‍යාංශයේ සේවයේ නියුතු එහි කාර්යමණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේවන විට රට තුළ ධාවනයට යොදාගන්නා මුළු පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) නිසි ලියාපදිංචිවීමකින් අනතුරුව ධාවනය වන පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) නිසි ලියාපදිංචිවීමකින් තොරව ධාවනය වන පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) 2000, 2003 සහ 2006 යන වර්ෂවලදී ධාවනය කරවන ලද පුද්ගලික බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ අටක කාලය තුළ පුද්ගලික බස් ගාස්තු සංශෝධනය වූ අවස්ථා කවරේද;

(ii) ඉකුත් කාලසීමාව තුළ අනුමත කරන ලද බස්ගාස්තු වැඩිවීම් කවරේද;

යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1967/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරන හටයින් දෛනික වැටුප් ලබමින් අවුරුදු විස්සකට වඩා වැඩි කාලයක් සේවය කරනු ලබන බවත්;

(ii) සේවය ස්ථිර නොකිරීම හේතුවෙන්, එම හටයින් දැඩි සේවා අවිනිශ්චිතභාවයකින් කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා සේවය කරන ලබනු සිවිල් ආරක්ෂක බලකායේ හටයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන එම හටයින්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරන හටයින්ගේ සේවය ස්ථිර කර විශ්‍රාම වැටුප් සහිත සේවාවක් බවට පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2324/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2004 සිට 2011 දක්වා කාල සීමාව තුළ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු මැද පළාතේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති වකුගඩු රෝගයට නිශ්චිත හේතු හඳුනාගැනීම සඳහා උපයෝගී කර ගත් ක්‍රමවේදය කවරේද;

(iii) මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග තුළින් එම රෝග ව්‍යාප්තිය පාලනය වී තිබේද;

(iv) නොඑසේ නම්, එම රෝගය පාලනයට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) කොළඹ ජාතික රෝහලේ සහ මහනුවර මහ රෝහලේ ඇති වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ශල්‍යකර්ම කිරීමට පහසුකම් සහිත වාට්ටු සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්මවලින් අනතුරුව අවශ්‍ය පහසුකම් යටතේ රජයේ රෝහල්වල රඳවා ගැනීමට හැකි වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වෙළඳපොලේ පවතින හිඟය නිසා දැනට අධික මිල ගණන් යටතේ අලෙවිකරන වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ ප්‍රමාණවත් ලෙස රජයේ රෝහල්වලට ලබා දීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2489/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා ඇති ශාසනාරක්‍ෂක බල මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එක් එක් ශාසනාරක්ෂක බල මණ්ඩලය වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු යොදා තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා ලබාදී ඇති මුදල් ප්‍රතිපාදන වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශාසනාරක්‍ෂක බල මණ්ඩලය නමින් හෝ එයට සමාන නමකින් හෝ අරමුදලක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම අරමුදල සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා ගන්නා ආකාරය කවරේද;

(iii) එම අරමුදලේ අභිප්‍රායන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2822/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු ජනගහණය කොපමණද;

(ii) වයස අවුරුදු 18 වැඩි ජනගහණය කොපමණද;

(iii) වයස අවුරුදු 18 වැඩි ජනගහණය අතරින් ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඡන්ද බලය අහිමි කරන ලද සහ අඛණ්ඩව ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ඡන්ද දායකයන් විශාල සංඛ්‍යාවක් සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඡන්දහිමි නාම ලේඛනය යාවත්කාලීන කිරීම වර්ෂයේ ජූනි මස පළමුවැනි දින සිට ජූලි මස තිස්එක් වැනි දින තෙක් කාලයට සීමා කරනු වෙනුවට එය වර්ෂය පුරා සිදුකිරීමට අවස්ථාව සැලසිය හැකිද;

(ii) ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතු කටයුත්තක් බවට පත්කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?